# බිත්තර වී නිෂ්පාදනය හා සම්බන්ධ ගැටළු සහ ඒවා වලක්වා ගැනීමට යෝජිත උපක්‍රම

ආචාර්ය එස්. එල් වීරසේන
*නියෝජ්‍ය අධ්‍යක්ෂක (බීජ සහතික කිරීමේ සේවය)*
සහ
ඩබ්.ජී. මද්වනආරච්චි
*(බීජ සහ රෝපණ ද්‍රව්‍ය අංශය) කෘෂිකර්ම දෙපාර්මේතුව*

**කෘෂිකාර්මික යෙදවුම් අතරින් ඉතාම වැදගත් වන්නේ උසස් තත්ත්වයෙන් යුත් බීජ හා රෝපණ ද්‍රව්‍යයයි. වෙනත් යෙදවුම් වලින් කළ හැකි වන්නේ බීජ වර්ගයට ආවේනික උසස් ඵලදායී බව වැනි ලක්ෂණ උපරිම කිරීමට ආධාරදීම පමණි.**

**ගුණාත්මක බීජ භාවිතයෙන් අස්වැන්න වැඩිකර ගත හැකි බව ගොවීහු දනිති. හොඳින් පිරුණු ගොයම් කරල් කපා, වියළි ස්ථානයක ගබඩාකර වගාව සඳහා යොදා ගැනීමට ගොවීහු පුරුදුව සිටියහ. ගොවිතැන නවීකරණය වීම නිසා ස්වයං බීජ නිෂ්පාදනය බොහෝ දුරට අඩු වී කන්නයක් පාසා බීජ සොයා යෑමට දැන් ඔවුහු පුරුදුව සිටිති**

. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති නව වී වර්ග වගා වපසරියෙන් 95% වැඩි ප්‍රමාණයක් දක්වා ප්‍රචලිත වී ඇති අවධියක ගොවීන් එම ප්‍රභේද වල බිත්තර වී ලබා ගැනීමට එම දෙපාර්තමේන්තුව දෙසට යොමු වීම අරුමයක් නොවේ. රටේ බිත්තර වී ඉල්ලුමට සරිලන උසස් තත්තවයේ බීජ නිෂ්පාදන ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීම රජයට විශාල වියදමක් හා පරිශ්‍රමයක් දැරිය යුතු වේ. එහිදී පැන නගින තාක්ෂණික ගැටළු ද ඉමහත් ය.

මෙම ගැටළු විසඳ, බීජ නිෂ්පාදනය ප්‍රශස්ථ මට්ටකම ගෙන ඒමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන අතර ඒ සඳහා යෝජිත උපක්‍රම කවරේදැයි සොයා බැලීම මේ ලිපියේ අරමුණයි.

**(අ) පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ බීජ වැඩ සටහන් වල කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීම**

සාමාන්‍යයෙන් අඩු වර්ධන කාලයක් ඇති වී ප්‍රභේද යල කන්නයෙත්, දිගු වර්ධන කාලයකින් සමන්විත වී ප්‍රභේද මහ කන්නයේත් වගා කරනු ලැබේ. එබැවින් යල කන්නයක ලබාගත් බීජ වී ඊළඟ යල කන්නයේ ප්‍රයෝජනය සඳහා ගබඩා කොට තැබිය යුතු වේ. ශ්‍රී ලංකාවේ අධික ආර්ද්‍රතාවයත්, උෂ්ණත්වයත් නිසා බීජ වී සාමාන්‍ය තත්ත්ව යටතේ මාස 09 කට වඩා ගබඩා කිරීමට අපහසු බැව් පෙනී ගොස් ඇත. කෘෂිකර්ම දෙපාර්මේන්තුව හා පෞද්ගලික ගොවීන් නිෂ්පාදනය කරන වී ප්‍රමාණයෙන් 30% ක් පමණ ප්‍රමාණයක ගුණාත්මක අගය ඊළඟ කන්නයේ බෙදා හැරීමට පෙර හානි වනු දැකිය හැක. මෙයට හේතුන් නම් බීජ සැකසීමේ දි ඇතිවන ප්‍රමාදය, පරිසර තත්ත්ව සහ ගබඩා කිරීමේ පහසුකම් අඩු වීමයි. එබැවින් ගබඩා කිරීමේ සහ බීජ සැකසීමේ පහසුකම් වැඩි දියුණු කිරීම ද, පාලනය දියුණු කිරීම ද අත්‍යවශ්‍ය වේ.

සිසිල් හා වියළි තත්ත්ව යටතේ බීජ ගබඩා කිරීමට හැකි නම් ඉහත කී අඩුපාඩු බොහෝ දුරට අඩු කරවා ගත හැක. වගුව 01 පෙන්නු කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අංශය සතු ගබඩා කිරීමේ හැකියාවයි. මේ සඳහා භාවිතා කරන යන්ත්‍ර බොහොමයක් යල් පැනගිය ඒවා බැවින් බීජ අපතේ යාම සිදුවේ. ඒවා වෙනුවට අළුත් යන්ත්‍ර සවි කිරීම අවශ්‍ය ය.

මූලික බීජ නිෂ්පාදණයේ (අත්තිවාරම් හා ලියාපදිංචි) අනාගතය රඳා පවතිනුයේ රජයේ ගොවිපල වල සාර්ථක භාවය මත බැවින් ඒවා ආරක්ෂා කර ගැනීමට හා නිෂ්පාදනය වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය නිසි පියවර ගත යුතු බව අවධාරණය කළ යුතුය.

**(ආ) බීජ නිෂ්පාදන වැඩ සටහන වැඩි දියුණු කිරීම:-**

වී ප(භේද 20 කට වැඩි ප්‍රමාණයක් දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන වැඩ සටහනට ඇතුලත් ය. ඒවා අත්තිවාරම්, ලියාපදිංචි හා සහතික යන ශ්‍රේණි වලින් වෙන් වෙන්ව නිෂ්පාදනය කළ යුතු ය. එබැවින් අස්වැන්න නෙලීමේ දී, සැකසීමේ දී සහ ගබඩා කිරීමේ දී ඒවා මිශ්‍ර නොවී පවත්වා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතුව ඇත. කරුණු එසේ වුව ද, එක් එක් පරිසර තත්ත්වයනට යෝග්‍ය සහ සුවිශේෂ ගුණාංගයන්ගෙන් හෙබි නව වී ප්‍රභේද නිෂ්පාදන වැඩ සටහනට තව දුරටත් ඇතුලත් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

**(ඇ) බීජ නිෂ්පාදන හා බෙදාහැරීමේ සංවිධාන ගොඩ නැංවීම**

බිත්තර වී නිෂ්පාදනය, ගබඩා කිරීම හා අලෙවිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා වසර 40 ක පමණ කාලයක් පවත්වා ගෙන ගොස් ඇත. එහෙත් සහතික බීජ මුළු අවශ්‍යතාව නිෂ්පාදනය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට තවමත් අපහසුය. එබැවින් අත්තිවාරම් සහ ලියාපදිංචි බීජ නිෂ්පාදනය පමණක් තම අත තබාගෙන, සහතික බීජ නිෂ්පාදනය ක්‍රමක්‍රමයෙන් පෞද්ගලික අංශයට සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු වලට පැවරීමට බීජ අංශය අපේක්ෂා කරයි. මේ අනුව සළකා බලන විට විශේෂ දැනුමක් ඇති හා කැපවීමකින් කටයුතු කරන වියලි කලාපයේ ගොවීන් බීජ නිෂ්පාදනයට හා අලෙවියට යොමු කිරීම සුදුසු බව පෙනී ගොස් ඇත. එබැවින් දැනටමත් එවන් ගොවි සංවිධාන දිස්ත්‍රික්ක පහ (05) ක ගොඩ නගා ඇත. ඔවුනට අවශ්‍ය තාක්ෂණික උපදේශ සහ අනෙකුත් ආධාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සැපයේ.

බීජ තත්ත්ව පාලනය, ගොවි පුහුණු කටයුතු, බීජ ගබඩා කිරීම හා යන්ත්‍ර මගින් පිරිසිදු කිරීමේ පහසුකම් ලබාදීම, සහ අලෙවිකරණය යන අංශ වල දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන වලට ආධාර කරයි.

1989 ට පෙර කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ බීජ අංශයේ නිෂ්පාදිත බීජ වී අලෙවි

කරනු ලැබුවේ දෙපාර්තමේන්තුවේ ම ව්‍යාප්ති අංශය මගිනි. බීජ වී අවශ්‍යතාවය තක්සේරු කිරීමේ අපහසුතාව නිසා ව්‍යාප්ති අංශය බොහෝ විට වැඩිපුර බීජ අවශ්‍යතාවයන් දැක්වූ බැව් වාර්තා වලින් පෙනී යයි.

මෙසේ අවශ්‍යතාවය වැඩි ලෙස තක්සේරු කිරීම, බීජ වී ලබා දීමේ දි ඇතිවන ප්‍රමාදය සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන වල නො විකිණී ඉතිරි වූ බීජ නිසා විශාල වශයෙන් පාඩු විඳීමට දෙපාර්තමේන්තුවට සිදු විය.

ගොවිජන සේවා මධ්‍යස්ථාන වල තිබී නො විකිණී ආපසු බාර ගන්නා බීජ බොහෝ විට කෘමී හානියට පාත්‍ර වන නිසා බීජ ගබඩාපාලනයේ දී ද ගැටළු රාශියක් මතු විය. එම නිසා 1986 දී චක්‍රලේඛයක් මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ඉතිරිවන බීජ වී, බීජ අංශයට ආපසු නො එවා, ධාන්‍ය ලෙස අලෙවි කිරීමට ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අවසර දෙන ලදී. මෙම චක්‍රලේඛය නිකුත් වීමත් සමග ව්‍යාපෘති අංශය ලබා ගන්නා බීජ වී ප්‍රමාණය අඩු වූ අතර, එහි ප්‍රතිඵලය වූයේ බීජ වී අලෙවිය අඩු වීමයි.

1989 දී කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් ලෙස පත් කළ අතර, බොහෝ ව්‍යාප්ති කටයුතු ද පලාත් සභා වලට පැවරිණි. මේ ක්‍රියා වලින් 1990 ට පෙර පැවැති ව්‍යාප්ති කටයුතු වෙනස් අතකට යොමුවූ බැවින්, බීජ බෙදා හැරීමේ දී වෙනස්කම් සිදුවීමට මුල් විය. එලෙසින් වඩා කාර්යක්ෂම බීජ අලෙවි ක්‍රමයක් ඇති කිරීම 1990 දශකයේ අභියෝගයක් විය.

1990 මුල් භාගයේ දී බීජ සඳහා තොග සහ සිල්ලර මිළ ක්‍රමයක් බීජ අංශය මගින් හඳුන්වා දුන් අතර, පෞද්ගලික වෙළෙඳුන්ට 10% වට්ටමක් ලබාදීමට ද කටයුතු කරන ලදී. මෙම වැඩ සටහන සඳහා සැහෙන උන්දුවක් වෙළඳුන් තුළ ඇති වූ අතර, බීජ විකිණීම සඳහා ලියාපදිංචි වූ වෙළෙඳුන් දිවයින පුරා බිහි විය. ඔවුන්ගෙන් ලැබෙන ඉල්ලුම් කිසිසේත් සපුරා ලිය නොහැකි තත්ත්වයක් දැන් උද්ගතව ඇත.

**(ඇ) ඇසුරුම් ප්‍රමාණය හා අසුරන ද්‍රව්‍යය තීරණය කිරීම:**

බීජ ඇසුරුම් මල්ලේ ප්‍රමාණය, ආකර්ශණීය බව සහ ඇසුරුම් වර්ගය බිත්තර වී වෙළෙඳාමට බලපාන බැවින් ඒ සඳහා සිත යොමු කළ යුතුව ඇත. මෑතක් වනතුරුම බිත්තර වී අසුරනු ලැබුවේ බුසල් දෙකේ ධාරිතාවයකින් යුත් ජුට් ගෝනි වලය. බොහෝ විට හිස් ගෝනි නැවත භාවිතා කිරීම සඳහා බීජ අංශය වෙත ආපසු බාර දෙනු ලැබිණ. දැන් විවිධ ප්‍රමාණයේ පොලි ප්‍රොපිලීන් මළු මේ සඳහා උපයෝගී කර ගනු ලැබේ.

එසේම ඇසුරුමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා වෙළෙඳ පොල සමීක්ෂණයක් පැවැත්වීමට ද තීරණය කොට ඇත. කෙසේ වුවද සමහර දිස්ත්‍රික්ක සඳහා බතලගොඩ (බී. ජී) වී වර්ග බුසලේ ඇසුරුම් වලින් ද, තවත් දිස්ත්‍රික්ක සඳහා කිලෝ ග්‍රෑම් 05 - 10 දක්වා වූ ඇසුරුම් බෝඹුවල (බී. ඩබ්ලිව්) වර්ග වලින් ද වෙළඳ පොලට ඉදිරිපත් කර ඇත.

**(ඉ) බීජ තත්ත්වය පාලනය කිරීම :**

පාරිභෝගිකයන් හට හොඳ තත්ත්වයේ බීජ ලබා දීම, බීජ තත්ත්ව පාලනයේ මුඛ්‍ය පරමාර්ථයයි. ව්‍යාජ ලේබල් යෙදූ අඩු ගුණාත්මයෙන් යුත් බීජ අලෙවිය නීති මගින් තහනම් කළ යුතු ය. ඒ සඳහා බීජ නීති පනතත් අවශ්‍යව ඇත.

**(ඊ) ආරක්ෂක බීජ එකතුව (ආරක්ෂක තොගය)**

හදිසි අවශ්‍යතාවයකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා මාස 3 - 3. 1/2 දක්වා වර්ධක කාලයකින් යුත් බීජ වලින් මෙට්‍රික් ටොන් දහස (1000) ක් ආරක්ෂණ බීජ ලෙස වෙන් කර තැබීම නිර්දේශ කෙරේ. මෙම කෙටි වර්ධක කාලයකින් යුත් වී ප්‍රභේද තියඟ සහ ගංචතුර වැනි අයහපත් කාලගුණයක් ඇති කන්න සඳහා ප්‍රයෝජනයට ගත හැක. මේ සඳහා ප්‍රාදේශීය ව්‍යාප්ති නිළධාරීන් හා සාකච්ඡා කොට ප්‍රාදේශීය පදනම මත සුදුසු බීජ වර්ග තෝරාගත යුතුය. මෙම බීජ එකතුව ගබඩා කිරීමට, වඩා සිසිල් දේශගුණික තත්ත්වයක් ඇති රහංගල වැනි ප්‍රදේශයක් සුදුසු වේ. මෙම ආරක්ෂණ බීජ තොගය භාවිතා කිරීමට අවකාශ නො ලද අවස්ථාවල ඒවා ඊළඟ වසරේ ධාන්‍ය වශයෙන් අලෙවි කර නව තොග ආරක්ෂන තොගයට ඇතුළු කල යුතු ය.


**(උ) ද්විතීයක බීජ නිෂ්පාදන වැඩ සටහන් ශක්තිමත් කිරීම :**

බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා උපයෝගී කරගත හැකි උපක්‍රමයකි, ග්‍රාමීය මට්ටමේ ස්වේච්ඡා බීජ නිෂ්පාදන ව්‍යාපෘතීන්, මෙම ස්වේච්ඡා බීජ නිෂ්පාදනය දැනට දිස්ත්‍රික්ක කිහිපයක ක්‍රියාත්මක වේ.මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි පරම්පරාවට අයත් බීජ තෝරා ගත් ගොවීනට විකුණනු ලැබේ. මිශ්‍ර වර්ගවල වී හඳුනා ගැනීම, නියැදි පරීක්ෂාව සහ ගෘහස්ථ මට්ටමින් ප්‍රරෝහණ හැකියාව නිර්ණය කිරීම වැනි කටයුතු සඳහා ගොවීනට පුහුණුවක් රජය ලබාදෙයි. අනාගතයේ දි මෙම සම්ප්‍රදායික බීජ සැපයීම තවදුරටත් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වෙයි.

**(ඌ) ප්‍රමුඛතා හඳුනා ගැනීම හා බීජ ප්‍රතිපත්තියක් ගොඩ නැගීම :**

බීජ නිෂ්පාදනයේ දි රජයට වන පාඩු අවම කිරීමටත් පෞද්ගලික අංශයේ සහයෝගීතාවය ලබාගත හැකිවන අයුරින් නව බීජ ප්‍රතිපත්තියක් ගොඩ නැඟීමේ අවශ්‍යතාවය දැන් පැන නැඟී ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ වෙළඳාම උපරිම වූයේ 1983 වර්ෂයේ දී ය. ඉන් පසුව නිෂ්පාදනය හා අලෙවිය පසුබෑමකට ලක්වී ඇත. ඒ සඳහා විවිධ ප්‍රතිපත්ති සහ පරිපාලන රටාවේ වෙනස් කිරීම් බලපා ඇති බව කිව හැක.

පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව බීජ නිෂ්පාදනය වැඩි කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් බීජ සැපයුම වැඩි කළ හැක.



පැල්වෙහෙර රජයේ බිත්තර වී ගොවිපලේ සැකසීම පිණිස බිත්තර වී ගොඩ ගසන අයුරු